## බහු විෂයයික පර්යේෂණ සම්මන්ත්‍රණය - 2023
## පුස්තකාලය, කැලණිය විශ්වවිද්‍යාලය

**හැඳින්වීම**

පුස්තකාල සහ ඒවායෙහි ඇති ද්විතීක මූලාශ්‍ර ඇසුරින් සිදුකරන පර්යේෂණ දිරිමත් කිරීමේ අරමුණින් කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලය විසින් මෙම බහු විෂයික සම්මන්ත්‍රණය සංවිධානය කරනු ලැබේ. මෙම බහු විෂයයික පර්යේෂණ සම්මන්ත්‍රණය සඳහා ලංකාවේ උසස් අධ්‍යාපන ආයතනයන්හි ඕනෑම පීඨයක අධ්‍යයන කාර්ය මණ්ඩලය, පර්යේෂකයින් සහ පශ්චාත් උපාධි අපේක්ෂකයන්ට සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා (Full papers) භාරදීම සිදු කළ හැක. මෙම සම්මන්ත්‍රණය සඳහා ලියාපදිංචිය නොමිලේ ය.

**ලිපි කැඳවනු ලබන විෂය ක්ෂේත්‍ර**

- කලාව හා මානව ශාස්ත්‍ර
- වාණිජ හා කළමනාකරණ අධ්‍යයන
- විද්‍යාව, තාක්ෂණය, සහ වෛද්‍ය විද්‍යාව
- සමාජීය විද්‍යා

**කතුවරුන් සඳහා නිර්නායක**

මෙම පර්යේෂණ සම්මන්ත්‍රණය සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම පර්යේෂණ පත්‍රිකා මීට පෙර වෙනත් කිසිදු සඟරාවක, සම්මන්ත්‍රණයක, ප්‍රකාශනයක හෝ කිසිදු මාධ්‍යයක ප්‍රකාශයට පත් නොවූ ඒවා විය යුතු ය. ඔබගේ පර්යේෂණ පත්‍රිකාව බහු විෂයයික පර්යේෂණ සම්මන්ත්‍රණයෙහි විෂය ක්ෂේත්‍රවලට අනුකූල විය යුතු ය. එවැනි පත්‍රිකා පමණක් බහු විෂයයික සම්මන්ත්‍රණයෙහි ශාස්ත්‍රිය සංග්‍රහයෙහි ප්‍රකාශයට පත් කිරීමට නියමිත ය. ඔබගේ පර්යේෂණ පත්‍රිකාව පහත ගූගල් අයදුම්පත (Google form) හරහා ඉදිරිපත් කළ යුතු ය: https://forms.gle/XRZPKoJQ95GKLAZg8

**පර්යේෂණ පත්‍රිකාව සම්පාදනයට අදාළ නිර්ණායක**

1. මෙම බහු විෂයයික පර්යේෂණ සම්මන්ත්‍රණය සඳහා සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා (Full papers) පමණක් ඉදිරිපත් කළ යුතු අතර පර්යේෂණ පත්‍රිකාවෙහි වචන සීමාව 3000-5000ත් අතර විය යුතු ය (විමර්ශන රහිතව). පර්යේෂණ පත්‍රිකා ඉංග්‍රීසි හෝ සිංහල යන භාෂා ද්විත්වයෙන් ම ඉදිරිපත් කළ හැකි අතර සිංහල බසින් ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ පත්‍රිකා සඳහා සාරසංක්ෂේපය (Abstract) ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කළ යුතු ය. එම සාරසංක්ෂේපයෙහි (Abstract) වචන 250-300ත් අතර සීමා විය යුතු ය. ප්‍රමුඛ පද 3-5 අතර විය යුතු ය.

    පර්යේෂණ පත්‍රිකාවේ පිටුවේ ප්‍රමාණය සහ ආකෘතිය : A 4 / MS Word Format
    අකුරු වර්ගය : FMAbhaya / Times New Roman
    අකුරුවල ප්‍රමාණය : 12
    පේළි අතර පරතරය : 1.5
    සීමා මායිම : 1" (2.5 cm)

පිටු අංකනය : සෑම පිටුවක්ම අංකනය කළ යුතු ය

**පර්යේෂණ පත්‍රිකාවෙහි මාතෘකාව** : ප්‍රධාන මාතෘකා-14, තදකළු අකුරු (bold), මැද (centered)

**කතුවරයා/කතුවරු** : අකුරු ප්‍රමාණය -12, Title case, Justified

**කතුවරයාගේ තනතුරු නාමය** : අකුරු ප්‍රමාණය -12, තද කළු අකුරු (bold), Left-justified

**ප්‍රධාන මාතෘකා/ව (Main heading/s)** : අකුරු ප්‍රමාණය -12, තද කළු අකුරු (bold), Title case, Left justified

**අනු මාතෘකා/ව** : අකුරු ප්‍රමාණය -12, ඇල අකුරු (italics), Title case, Left justified

2. පර්යේෂණ පත්‍රිකාවෙහි අන්තර්ගතය සඳහා පහත සඳහන් නිර්ණායක අනුගමනය කළ යුතුය.
   - පර්යේෂණ පත්‍රිකාවෙහි කතුවරයා/කතුවරු, තනතුර, විද්‍යුත් ලිපිනය, ORIDID ඇත්නම් පමණක්
   - සාරසංක්ෂේපය (Abstract): සාරසංක්ෂේපයෙහි අනිවාර්යෙන් ම පර්යේෂණ අරමුණු, ක්‍රමවේදය, ප්‍රතිඵල සහ නිගමන/නිර්දේශ (ඇත්නම්) ඇතුළත් විය යුතු ය. වචන 250-300ත් අතර සීමා විය යුතු ය.
   - ප්‍රමුඛ පද: 3-5 ඇතුළත් කළ යුතුය.
   - හැඳින්වීම: අධ්‍යයන පසුබිම, සාහිත්‍ය විමර්ශනය, පර්යේෂණ ගැටලුව, අරමුණු හා පරමාර්ථ, පර්යේෂණ ප්‍රශ්න ඇතුළත් විය යුතු ය.
   - පර්යේෂණ ක්‍රමවේදය/පර්යේෂණ ක්‍රම/පර්යේෂණ සැලැස්ම: පර්යේෂණ ක්‍රමෝපායන්, අධ්‍යයන සංගහනය හා නියැදිය, නියැදි ක්‍රමවේදයන්, දත්ත විශ්ලේෂණ හා විශ්ලේෂණ ක්‍රම ඇතුළත් විය යුතු ය.
   - ප්‍රතිඵල සහ සාකච්ඡාව: අධ්‍යයනයේ සොයාගැනීම් සහ ප්‍රතිඵල පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් සහ අර්ථකථනයක් එයට ඇතුළත් විය යුතුය. සොයාගැනීම්වල වැදගත්කම සහ ප්‍රතිඵල පෙර පර්යේෂණ හා සමගාමීව සාකච්ඡා කළ යුතු ය.
   - නිගමන සහ නිර්දේශ: අධ්‍යයනයේ ප්‍රධාන සොයාගැනීම් එයට ඇතුළත් විය යුතු අතර වැඩිදුර ගවේෂණය සඳහා යෝජනා ඉදිරිපත් කරමින් අධ්‍යයනයේ ප්‍රතිඵල මත පදනම්ව ප්‍රායෝගික නිර්දේශ ඉදිරිපත් කළ යුතු ය.
   - විමර්ශන ක්‍රමවේදය: පෙළ උපුටා දැක්වීම්, සහ උද්ධෘත සඳහා APA 7 වන සංස්කරණය අනුගමනය කළ යුතුය.

3. රූපසටහන් සහ වගු:

   - රූපසටහන්හි මාතෘකාව රූපසටහනට පසුව තිබිය යුතු ය.
   - වගුවෙහි මාතෘකාව වගුවට ඉහළින් තිබිය යුතු ය.
   - රූපසටහන් සහ වගු අදාළ පෙළ සමග තිබිය යුතු ය.
   - රූපසටහන් මාතෘකා : font-12, bold, title case, centered
   - වගු මාතෘකා : font-12, bold, title case, left-justified
   - වර්ණ : කළු සහ සුදු

4. පර්යේෂණ අත්පිටපත් පිළිබඳ තීරණ:

බහු විෂයයික පර්යේෂණ සම්මන්ත්‍රණයට ඉදිරිපත් කරන ලද සියලුම අත්පිටපත් ද්විත්ව සමියුරු සමාලෝචනයක් (double-blind peer review) සිදු කෙරේ. බුද්ධිමය දේපල අයිතිවාසිකම් උල්ලංඝනය වීම වැලැක්වීම සඳහා අත්පිටපත් රචනා චෞරත්වය පරීක්ෂණ මෘදුකාංගයක් (Plagiarism Detecting Software) මගින් පරීක්ෂා කරනු ලැබේ. සමානතා අනුපාතය (Similarity Rate) 20%ට සමාන හෝ අඩු විය යුතුය.

5. ප්‍රකාශය:

ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ පත්‍රිකාව නවතම පර්යේෂණයක් බවට එකඟ වන ප්‍රකාශ පත්‍රයක් කතුවරුන් විසින් අත්සන් කළ යුතු ය. එහි මෙම පර්යේෂණ පත්‍රිකාව මීට පෙර වෙනත් ස්ථානයක ප්‍රකාශයට පත් කර නොමැති බව, එය වෙනත් තැනක ප්‍රකාශනය සඳහා සලකා බලමින් නොපවතින බව සහ ප්‍රකාශන හිමිකම් සහිත තොරතුරු පර්යේෂණ පත්‍රිකාව සඳහා භාවිත කර ඇති බව සඳහන් කළ යුතු ය. අවසාන අත්පිටපත පිළිගත් පසු ප්‍රකාශය පිළිබඳ පෝරමය (Declaration form) කතුවරයා වෙත යවනු ලැබේ.

පර්යේෂණ පත්‍රිකාව පිළබඳ අවසන් තීරණ දැනුම් දීම සහ ලියාපදිංචිය පිළිබඳ තොරතුරු editor-drclib@kln.ac.lk විද්‍යුත් තැපැල ඔස්සේ දැනුම් දෙනු ලැබේ.

**විශේෂිත දින** :

| | |
|---|---|
| පර්යේෂණ පත්‍රිකාව භාරගන්නා අවසන් දිනය | : 2023. 10. 15 |
| පර්යේෂණ පත්‍රිකාව පිළිබඳ තීරණ දැනුම්දීම | : 2023. 10. 30 |
| සංශෝධිත පර්යේෂණ පත්‍රිකාව භාරදීම | : 2023. 11. 15 |
| ලියාපදිංචිය | : 2023. 11. 20 |

**විමසීම්** :

**ප්‍රධාන සංස්කාරක** :

**ආචාර්ය අචලා රණවීර**
071-7871798
editor-drclib@kln.ac.lk
https://conf.kln.ac.lk/drc/

**සහාය සංස්කාරක** :

**ධම්මික රත්නායක**
071-4888898
https://conf.kln.ac.lk/drc/